**උතුරු පළාතේ තිරසර ධීවර සංවර්ධනය සඳහා සැලසුම් ඉදිරිපත් කිරීම සඳහා වන ව්‍යාපෘතිය - 2018**

---

උතුරු පළාතේ තිරසර ධීවර සංවර්ධනය සඳහා සැලසුම් ඉදිරිපත් කිරීම සඳහා වන 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2017 මාර්තු 17 දින එළඹි අංක 6011 - පීඩීඒ දරන ණය ගිවිසුමේ 1V(4.04) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘතියේ කාලය

ණය ගිවිසුම ප්‍රකාරව, ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතියේ විධායක නියෝජිතායතනය හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපාතියේ අරමුණු වන්නේ, ධීවර කර්මාන්තයේ තටිතල පහසුකම් තිරසර උපයොජනය සඳහා ධීවර වරාය, නැංගුරම් ස්ථාන හා ගොඩබෑම් ස්ථාන පිළිබඳ විස්තරාත්මක සැලැස්මක් සිදු කිරීම වේ. ව්‍යාපෘතියේ කාර්යයන් ධීවර වරාය, නැංගුරම් ස්ථාන හා ගොඩබෑම් ස්ථාන පිළිබඳ විස්තරාත්මක සැලැසුම් සිදු කිරීම යන සංරචකය යටතේ ක්‍රියාත්මක වේ. ණය ගිවිසුම ප්‍රකාරව, ව්‍යාපාතියේ ඇස්තමේන්තුගත මුලු පිරිවැය රු. මිලියන 242.43 කට සමාන එජඩො මිලියන 1.59 ක් වන අතර ඉන් රු. මිලියන 198.11 කට සමාන එජඩො මිලියන 1.30 ක් ආසියානු සංවර්ධන බැංකුව විසින් මූල්‍යානය කරනු ලැබේ. ඉතිරි මුදල වූ රු. මිලියන 44.32 ක් ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යානය කිරීමට අපේක්ෂා කරනු ලැබේ. ව්‍යාපෘතියේ කාර්යයන් 2017 මාර්තු 20 දින ආරම්භ කරන ලද අතර 2018 ජුනි 01 දින වන විට නිම කිරීමට නියමිතය. කෙසේ වුවද, ව්‍යාපෘතියේ කාර්යයන් නිම කිරීමේ දිනය 2019 දෙසැම්බර් 31 දින දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 මතය

ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම් මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තව දුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය පිළිබඳ වගකීම දරණ පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. භෞතික කාර්යසාධනය

### 2.1 ව්‍යාපෘතියේ කාර්යයන්හි භෞතික ප්‍රගතිය

පේසාලේ හා පොයින්ට් පේද්‍රු ධීවර වරායන් ඉදිකිරීමේ සැලසුම් සකස්කිරීමෙන් ව්‍යාපෘතියේ කාර්යයන් සමන්විත වී තිබුණි. කෙසේවුවද, රු.මිලියන 10.39 ක මුදලක් වැය කිරීමෙන් පසු පේසාලේ ධීවර වරායේ සැලසුම් සකස්කිරීම ව්‍යාපෘති විෂය පථයෙන් ඉවත් කරගෙන තිබුණු අතර පොයින්ට් පේද්‍රු ධීවර වරායේ සැලසුම් වෙනස් කිරීමට ද තීරණය කර තිබුණි.එසේම, සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාත්මක කරනු ලැබූ කාර්යයන්වල භෞතික ප්‍රගතිය සම්බන්ධයෙන් වූ වාර්තා ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන ගොස් ද නොතිබුණි.